Marked for 2020

# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

### මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය

## මානව හිමිකම් සහ සාම අධ්‍යයනය පිළිබඳ දුරස්ථ ඩිප්ලෝමා පාඨමාලාව - 2009 / 2010

## පළමු ප්‍රශ්න පත්‍රය - මානව හිමිකම්

(පැය දෙකයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව- 06

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

**(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.)**

01. මානව හිමිකම් නීතිමය අයිතීන් වේ යන්න පැහැදිලි කරන්න. විශ්වමය මානව හිමිකම් සංකල්පය හා මනාව ගැලපෙන ඔබගේ ඇතැම් ආගමික හෝ වෙනත් විශ්වාසයන් ඇසුරෙන් නිදසුන් දක්වන්න.

02. මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය අතර පවතින සම්බන්ධය කුමක් ද? රාජ්‍යයන්ට තම ජාතිකයන් සම්බන්ධයෙන් අසීමිත බලයක් නොපවතින්නේ යැයි සලකන්නේ මන්ද? ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය ලක්ෂණයන් කෙරෙහි අවධානය යොමු කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

03. ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා "අයිතිවාසිකම් බිල්පතක්" අත්‍යවශ්‍ය යැයි පවසන්නේ මන්ද? යම් රටක අධිකරණයකට එම රටේ "අයිතිවාසිකම් බිල්පතක්" අර්ථ නිරූපණය කිරීම සඳහා සහායක් ලෙස අන්තර්ජාතික මානව හිමිකම් ලේඛනයන් බලාත්මක කිරීම උචිත වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

04. දශකයට පෙරාතුව යටත් විජිත පාලකයන්ගෙන් නිදහස ලබා ගත් සංවර්ධනය වෙමින් පවතින සිම්ගානා නමැති කුඩා රාජ්‍යය මෑතක දී සිදු වූ සුනාමි ඛේදවාචකය හේතු කොට ගෙන දරුණු සාගතයකට මුහුණ දෙයි. තත්ත්වය පාලනය කිරීම සඳහා සිම්ගානා රජය පනතක් සම්මත කරන

අතර එමගින් ජනතාවට තමන්ගේ වාසස්ථානවලින් බැහැරවීම සහ නගරය දෙසට පැමිණීම සීමා කරයි. බොහෝ අන්තර්ජාතික ආයතන බලපෑමට පත් ජනතාවට ආධාර කිරීම පිණිස ඔවුනට නිදහසේ ඔබ මොබ යාම සඳහා වාහන සැපයීමට ඉදිරිපත් වුවත් රජය එය අනුමත නොකරයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රටේ සිටින ප්‍රධානතම අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානය තම කාර්යාලය වසා රටින් පිට වෙයි.

ඉහත විස්තර කළ තත්ත්වය හා සම්බන්ධිත අයිතිවාසිකම් පිළිබඳ කරුණු පිළිබඳ ව අදහස් දක්වමින් විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයාට වාර්තාවක් ඉදිරිපත් කරන්න. ඔබේ අදහස් දැක්වීම් සඳහා හේතු දක්වන්න.

5. මානව හිමිකම් සහ රාජ්‍ය පරමාධිපත්‍යය නොගැලපෙන සංකල්පයන් නොවුවද, බොහෝ දෙනෙකු විශ්වාස කරන්නේ රාජ්‍යයක බලතල සීමා කිරීම එම රාජ්‍යයේ අභ්‍යන්තර කටයුතුවලට සිදු වන මැදිහත්වීමක් ලෙසයි.

ඔබ එකඟ වන්නෙහිද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

6. පහත සඳහන් ඕනෑම තුනක් (03) පිළිබඳ ව සටහන් ලියන්න.

(අ) මානව හිමිකම් කවුන්සිලය

(ආ) 1961 ඊච්මාන් නඩු විභාගය

(ඇ) අන්තර්ජාතික අපරාධ අධිකරණයේ අපක්ෂපාතී අභිචෝදකවරයා

(ඈ) මානව හිමිකම් ලේඛනයන්හි ඇති සීමා කළ නොහැකි අයිතීන් පිළිබඳ ප්‍රතිපාදන

(ඉ) මානව හිමිකම් සම්මුතීන්හි ස්වභාවය

Marked for 70 20

**කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය**

**මානව හිමිකම් සහ සාම අධ්‍යයනයන් පිළිබඳ දුරස්ථ ඩිප්ලෝමා පාඨමාලාව**

**2009 / 2010**

**සාම අධ්‍යයනයන් (පැ දෙකයි)**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව - **06**

ප්‍රශ්න __තුනකට පමණක්__ පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත්අකුරු වලට ලකුණු අඩු කෙරේ.)

1. පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.
   - (අ) පිළිගැටුම
   - (ආ) සාමය
   - (ඇ) සාමය ගොඩනැගීම

2. පහත දැක්වෙන ගිවිසුම්/එකගත්වයන් හි වැදගත් අංගයන් පැහැදිලි කරන්න.
   - (අ) 1957 හි බංඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම
   - (ආ) 1965 හි ඩඩ්ලි සේනානායක - චෙල්වනායගම් ගිවිසුම
   - (ඇ) 1987 හි ඉංදු - ලංකා ගිවිසුම

3 සාමය මිනිසුන් සතු හිමිකමක් ද යන්න සාකච්ඡා කරන්න.

4. ශ්‍රී ලංකාවෙහි පවතින පිළිගැටුම් සඳහා පාදක මූලික හේතුන් සාකච්ඡා කරන්න.

5. පිළිගැටුම් බේරුම් කිරීම සඳහා පවතින විවිධ ක්‍රමවේදයන් පැහැදිලි කරන්න.

6. ජාත්‍යන්තර සාමය පවත්වාගෙන යාම පිණිස එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO) සතුටුදායක කාර්යභාරයක් ඉටු කරන්නේද යන්න සාකච්ඡා කරන්න.

**********************************************************